ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව
126, නාවල පාර, නුගේගොඩ.
தேசிய கல்வி ஆணைக்குழு
126, நாவல வீதி, நுகேகொட.
National Education Commission
126, Nawala Road, Nugegoda, Sri Lanka.

Chairman: +94112 815701 Secretary: +94112 815703 Fax: +94112 816178 E-Mail: secnec@slt.lk Web: www.nec.gov.lk

UNIVERSITY OF COLOMBO
06 NOV 2017

UNIVERSITY OF COLOMBO, SCHOOL OF COMPUTING
08 NOV 2017
DIRECTOR'S OFFICE

2017.11.01

උපකුලපතිතුමා
කොළඹ විශ්වවිද්‍යාලය
කුමාරතුංග මුනිදාස මාවත
කොළඹ 03.

උපකුලපතිතුමනි,

ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනය පිළිබඳව ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා අදහස් හා යෝජනා ලබා ගැනීම

ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය සම්බන්ධයෙන් සියලුම ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි ප්‍රතිපත්ති සම්පාදනය සඳහා 1991 අංක 19 දරන පාර්ලිමේන්තු පනත මගින් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව ස්ථාපිත කර ඇත.

අධ්‍යාපන ක්ෂේත්‍රයේ පවතින ජාතික අවශ්‍යතා හා ගෝලීය ප්‍රවණතා කෙරෙහි අවධානය ඇතිව ඉදිරි දශකයට උචිත අධ්‍යාපන ප්‍රතිපත්ති හා සැලසුම් සකස් කිරීම සඳහා ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව ප්‍රතිපත්ති සමාලෝචන ක්‍රියාවලියේ නිරතව සිටී.

ඒ අනුව, ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන පද්ධතිය දියුණු කිරීම උදෙසා වර්තමාන උසස් අධ්‍යාපන පද්ධතියේ ක්‍රියාත්මක ප්‍රතිපත්ති හා සැලසුම්වල සිදුකළ යුතු වෙනස්කම් සහ නව ප්‍රතිපත්ති හා යෝජනා පිළිබඳව විශ්වවිද්‍යාල උපකුලපතිතුමන්ලාගෙන්, පීඨාධිපතිතුමන්ලාගෙන්, අංශ ප්‍රධානීන්ගෙන්, කතිකාචාර්යවරුන්ගෙන්, අනධ්‍යයන කාර්යය මණ්ඩලයෙන් සහ විද්‍යාර්ථීන්ගෙන් අදහස් හා යෝජනා ලබා ගැනීමට කොමිෂන් සභාව අපේක්ෂා කරයි.

ඒ අනුව, ඔබතුමාගේ ලිඛිත යෝජනා පහත දැක්වෙන අංශ යටතේ අප වෙත ලබා දෙන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමු.

1. විශ්වවිද්‍යාල ප්‍රවේශය, පොදු මූලධර්ම.
2. ඉල්ලුම ඇති නව විෂයය/විෂයය ක්ෂේත්‍රයන් හඳුනා ගැනීම.
3. පශ්චාද් උපාධි අධ්‍යාපනය සහ පර්යේෂණ.
4. අධ්‍යයන හා අනධ්‍යයන කාර්යමණ්ඩල සංවර්ධනය.
5. ශිෂ්‍ය සුභසාධනය සහ විනය.
6. රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයතනයන්හි උසස් අධ්‍යාපන ප්‍රවේශයන් පුළුල් කිරීම.
7. මූල්‍ය හා සම්පත් කළමනාකරණය.
8. වෘත්තිය මාර්ගෝපදේශනය සහ උපදේශනය.
9. රාජ්‍ය විශ්වවිද්‍යාලයන්හි ගුණාත්මකභාවය සහතිකකරණය හා ප්‍රතීතනය.
10. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද උපාධි පිරිනමන රාජ්‍ය නොවන ආයතනයන්හි ගුණාත්මකභාවය සහතිකකරණය සහ ප්‍රතීතනය.
11. උසස් අධ්‍යාපනය පිළිබඳව වෙනත් යෝජනා.

ලිඛිත යෝජනා සභාපති, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව, 126, නාවල පාර, නුගේගොඩ, යන ලිපිනයට තැපැල් මගින් හෝ විද්‍යුත් තැපැල් (chnec@slt.lk) මගින් හෝ ෆැක්ස් (94112816177-8) මගින් යොමු කළ හැක. මේ පිළිබඳව ඔබ විශ්වවිද්‍යාලයේ *පීඨාධිපතිවරුන්, අංශ ප්‍රධානීන්, කතිකාචාර්යවරුන්, අනධ්‍යයන කාර්ය මණ්ඩලය සහ විද්‍යාර්ථීන්* දැනුවත් කරන මෙන් ද කාරුණිකව ඉල්ලා සිටිමු.

මෙයට - විශ්වාසී,

ඩබ්ලිව් අයි. සිරිවීර
සභාපති
ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව

Regr
Directors
Deans
R
Pl. bring to your notice
7/11
VC
Com
R
Dean
VC
7/11

cc: all staff - Pls. publish in VLEs.